// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2125/5 - 2019 මැයි මස 27 වැනි සඳුදා - 2019.05.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ මඩකලපුව මහ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

පක්ෂ සාමාජිකත්වය අහිමිවීම හේතුකොට ගෙන මඩකලපුව මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ මඩකලපුව මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ සිවලිංගම් සෝමසුන්දරම් අයත් වන්නා වූ ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම මඩකලපුව මහ නගර සභාවේ තෝරා ඒවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා වඩිවේල් කුබේරන් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

මඩකලපුව මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරී, රාජේන්ද්‍රන් සසීලන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් වඩිවේල් කුබේරන්, මඩකලපුව මහ නගර සභාවේ තෝරා ඒවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ආර්. සසීලන්,
තේරීම්භාර නිලධාරී,
මඩකලපුව මහ නගර සභාව.

2019 මැයි මස 24 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මඩකලපුව.

06 - 179

1A - G 30159 — 27 (2019/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*